# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අධිකරණ අමාත්‍යතුමිය විසින් 2018 අප්‍රේල් මස 06 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 මාර්තු මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[243 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට 122අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ වරදක් කරන ලදැයි චෝදනා ලැබ සිටින, වයස අවුරුදු දොළහක් හෝ ඊට වැඩි වූ ද, අවුරුදු දහ හතරකට අඩු වූ ද, ළමයකු සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 76 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සහ ඒ ළමයාගේ බුද්ධියේ පැසුණුභාවය පිළිබඳ ව මතයක් ගොඩනගා ගැනීමට මහෙස්ත්‍රාත්වරයාට සහාය වනු පිණිස, ඒ ළමයාගේ මව, පියා හෝ භාරකරුගේ කැමැත්ත ඇතිව, ඒ ළමයා ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු හෝ අදාළ ක්ෂේත්‍රයේ වෙනත් විශේෂඥයකු මගින් පරීක්ෂා කරවා ගැනීමට, පොලිස් ස්ථානභාර නිලධරයකුට හැකි කරවීම වේ.

එල්. ඩී.—ඕ. 42/2016

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතට 122අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 122 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 122අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"වයස අවුරුදු දෙළහක හෝ ඊට වැඩි, සහ වයස අවුරුදු දහහතරට අඩු ළමයකු විසින් සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණය.

122අ. (1) වයස අවුරුදු දොළහක හෝ ඊට වැඩි වයස අවුරුදු දහහතරට අඩු ළමයකු විසින් සිදු කරන ලදැයි කියනු ලබන වරදක් විමර්ශනය කරන පොලිස් ස්ථානය භාර නිලධරයකු විසින්-

(ආ) එම ළමයා විසින් කරන ලදැයි කියනු ලබන වරදේ ස්වභාවය සහ එහි ප්‍රතිඵල නිශ්චය කිරීමට ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් එම ළමයා ලබා තිබේ ද යන්න; සහ

(අ) එම ළමයාට යම් චිකිත්සක ප්‍රතිකාරයක් අවශ්‍ය වන්නේ ද යන්න,

පිළිබඳ ස්වකීය මතය, ඒ කාරණය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා ගොඩනගා ගැනීමට හැකි කරවන්නා වූ වාර්තාවක් ලබා ගැනීම සඳහා, එම ළමයාගේ මව, පියා හෝ භාරකරුගේ කැමැත්ත ඇතිව එම ළමයා ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු හෝ අදාළ ක්ෂේත්‍රයේ වෙනත් විශේෂඥයකු මගින් පරීක්ෂා කරවා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) එම ළමයාගේ මව, පියා හෝ භාරකරු, ළමයා එසේ පරීක්ෂා කරනු ලැබීමට කැමැත්ත නොදෙන අවස්ථාවක දී, එම ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයාට හෝ වෙනත් විශේෂඥයාට ළමයා පරීක්ෂා කිරීමට බලය ලබා දෙන ආඥාවක්, ඒ කාරණය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාගෙන් ලබා ගැනීමට පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(3) ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා හෝ වෙනත් විශේෂඥයා විසින් තම වාර්තාව පොලිස් ස්ථානය භාර නිලධරයාට ඉදිරිපත් කළ යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහයේ 76 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, (1) වන උපවගන්තියේ සඳහන් පරිදි මහෙස්ත්‍රාත්වරයාගේ මතය ගොඩනගා ගැනීමට සහ තීරණය ගැනීමට ඔහුට සහායවීම පිණිස ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා විසින් එම වාර්තාව මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.